**සමුපකාර සංවර්ධන අරමුදල - 2020**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමුපකාර සංවර්ධන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

--මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන,වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ප්‍රමිත අංක 2 හි 40 ඡේදය ප්‍රකාරව රු.16,395,006 ක් වූ ආයෝජන පොලී ලැබීම් ආයෝජන මුදල් ප්‍රවාහයක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනම හෙළිදරව් කර නොතිබුණි. | 2021 වර්ෂයේදී ගිණුම් මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

| | | |
|---|---|---|
| **(ආ)** සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද රු.5,481,500 ක් වූ ජංගම නොවන වත්කම් අරමුදල විසින් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණද ප්‍රමිත අංක 7 හි 65 ඡේදය ප්‍රකාරව වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කර නොතිබුණු අතර, ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රමිත අංක 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රත්‍යාගණන කටයුතු අවසන් කර ගිණුම් නිවැරදි කර ඇති බව. | -එම- |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට බැංකුවට කරන ලද සෘජු බැර කිරීම් අනුව රු.9,844,298 ක් වූ මුදල හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මෙම සෘජු බැර කිරීම් කොවිඩ් 19 අත්‍යාවශ්‍ය බෙදාහැරීමේ වැඩ සටහනට අදාල වන අතර දැනට රු.8,647,298 ක බැංකු තැන්පතු හඳුනාගෙන නිවැරදි කර ඇති බව. | සෘජු බැර කිරීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුයි. |
| (ආ) ඉකුත් වර්ෂවලදී අක්‍රිය සමිති වලින් ලැබිය යුතු ණය පොලිය රු.892,864 ක් වැඩියෙන් දැක්වීම හේතුවෙන් ලැබිය යුතු ණය පොලිය හා සමුච්චිත අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | උපලේඛණ 07දැක්වෙන 2020දෙසැම්බර් දිනට සමුපකාර සමිති වලට ලබා දී ඇති ණය පොළිය රු 7,704,272.ක් ලෙස ජ'නල් සටහන් මගින් නිවැරදි කර ඇති බව. | ණය පොලිය නිවැරදිව ගණනය කර ගිණුම්වලට ගත යුතුයි. |

**1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| (අ) සමූපකාර සමිති ණය | 47,164,884 | ශේෂ සනාථන | වසර ගණනක් පැරණි ණය ශේෂ වන අතර ක්‍රියාකාරී සමිති හඳුනා ගැනීමෙන් අනතුරුව ශේෂ | සනාථන ලබා ගැනීමට කටයුතු කල යුතුයි. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කඩිනමින් ලබා ගැනීමට කටයුතු කරන බව. | |
| (ආ) නොපියවූ අත්තිකාරම් | 45,525 | ශේෂ සනාථන | මේ පිළිබද සොයාබලා නිරවුල් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) වෙනත් ජංගම වත්කම් | 20,000 | ශේෂ සනාථන | මෙය අතිරික්ත අරමුදලින් ලැබිය යුතු ශේෂයක් බවත් සොයාබලා නිරවුල් කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) ණය ලබාදීම ඌව පලාත | 5,439,905 | ශේෂ සනාථන | ශේෂ සනාථන ලබාගැනීමට කටයුතු කර විගණනය සඳහා ඉදිරිපත් කරන බව. | -එම- |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.132,772,822 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.92,070,503 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.40,702,319 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට දායක මුදල් ආදායම් රු.19,317,908 කින් වැඩිවීම, අඩමාන ණය වෙන් කිරීම රු.6,057,034 කින් අඩුවීම, සමූපකාර දින උත්සව වියදම් රු.11,162,955 කින් අඩුවීම, විදේශ ගමන් වියදම් රු.40,090,179 ක් අඩුවීම මෙන්ම සමාලෝචිත වර්ෂයේ ප්‍රකාශන හා දැනුවත් කිරීමේ වියදම් හා නව ව්‍යාපෘති හඳුන්වාදීමේ වැඩසටහන් වියදම් සිදු නොවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 ජනවාරි 01 දිනට අක්‍රීය සමිති 54කින් රු.31,287,451 ක් හා සක්‍රීය සමිති දෙකකින් රු. 3,016,480 ක්ද වශයෙන් එකතුව රු.34,303,931 ක හිඟ ණය ශේෂයක් හා පොලිය රු. 7,704,272ක් අයවීමට පැවතියද සමාලෝචිත වර්ෂයේදී කිසිදු මුදලක් අය වී නොතිබුණි. එම ණය හා පොලිය වර්ෂ 8 ක සිට වර්ෂ 56 ක් දක්වා කාල පරාසයක සිට අය නොවී පවතින | 2000 වර්ෂයට පෙර අය නොවී පවතින පළාත් සමිති වල ණය අයකර ගැනීම සඳහා පළාත් දෙපාර්තමේන්තු වෙත පැවරීමටත්, මෙම දෙපාර්තමේන්තුවට අයත් සමිති වල අක්‍රීය ණය කපාහැරීමටත්, 2000 වර්ෂයට පසුව අයනොවී පවතින ණය ප්‍රතිලේඛණගත කර පොළී සහන ලබාදී හෝ අයකිරීම | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | ශේෂයන් වූ අතර ඉන් සමිති 20 කට ලබා දුන් රු.8,450,900 ක් වූ ණය මුදලින් කිසිදු ණය වාරිකයක් අය වී නොතිබුණි. තවද 2012 වර්ෂයේදී සීමාසහිත කොබෙයිගනේ විවිධ සේවා සමූපකාර සමිතියට ලබා දී තිබූ රු.3,000,000 ක් වූ ණය මුදල වාරික 54 කින් ගෙවා නිම කල යුතුව තිබුණද එම ණය මුදලින් 2013 වර්ෂයේදී එක් වාරිකයක් පමණක් ගෙවා තිබුණි. | හෝ නෛතික ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කර ඇති බව. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් යටතේ දක්වා තිබුණු 1997 වර්ෂයේ සිට පැවත එන රු.2,666,000 ක් වූ සමූපකාර විදුහල් ණය, 2012 වර්ෂයට පෙර සිට පැවත එන රු.1,999,600 ක් වූ කාර්යසාධන අත්තිකාරම් හා රු.1,184,000 ක් වූ ලැබිය යුතු උසාවි වන්දි මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධව ලිපිගොණු සොයාබලා ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බවත් හැකි ඉක්මනින් උසාවි වන්දි රු.184,000 ගෙවා අවසන් කරන ලෙස නිලධාරියා දැනුවත් කර ලිපි යවා ඇති බව. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01 දිනට සමූපකාර සමිති 42 කින් රු.146,999,075 ක දායක මුදලක් අරමුදල වෙත ලැබිය යුතුව පැවති අතර, සමාලෝචිත වර්ෂයට අදාලව සමිති 28 ක් සඳහා රු.120,930,257 ක දායක මුදලක් ලැබිය යුතුව තිබුණි. ඉන් සමාලෝචිත වර්ෂය තුලදී සමිති 16 කින් රු.47,272,173 ක දායක මුදලක් පමණක් අයකරගෙන තිබුණි. | පසුගිය වසරේ සිට අයකර ගැනීමට ඇති හිග දායක මුදල් ප්‍රවර්ථන වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | -එම- |
| (ඇ) | 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු දායක මුදල් රු.219,649,334 ක ශේෂයක් පැවති අතර ඉන් රු.161,338,906 ක් එනම් සියයට 73 ක ඉහළ ප්‍රතිශතයක් සීමාසහිත සමූපකාර අධ්‍යාපන සේවා නියුක්තිකයන්ගේ සමූපකාර සමිතියෙන් අයවිය යුතුව පැවතුණි. ණය ශේෂයන් තුල වර්ෂ 05 කට වඩා පැරණි ශේෂ එකතු වටිනාකම රු.28,794,753 ක් ද, හා වර්ෂ 01 ක සිට 05 ක් දක්වා කාලය තුළ තුල ලැබිය යුතු ශේෂය රු.190,854,581 ක් විය. | පසුගිය වසරේ සිට අයකර ගැනීමට ඇති හිග දායක මුදල් ප්‍රවර්ථන වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කල යුතුයි. |

(ඉ) **චක්‍රීය අරමුදල**

---------------

| | | |
|---|---|---|
| (i) අරමුදලින් පළාත් සමූපකාර සංගම් 09 සඳහා 2010 වර්ෂයේ සහ 2011 වර්ෂයේදී ලබාදුන් රු.මිලියන 290 ක ණය මුදලින් 2020 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 134 ක් අයවීමට පැවති අතර උතුරු මැද පළාතෙන් 2018 වර්ෂයෙන් පසු කිසිදු මුදලක් අය නොවූ ණය වටිනාකම රු.5,826,500 ක් විය. | මෙම ණය මුදලින් උතුරු මැද පළාතින් පමණක් හිඟ හිටි වාරික 58 වන රු.5,826,500 ක මුදලක් හිඟව පවතී.අනෙකුත් සියළුම පළාත් ගිවිසුම්ගත ආකාරය අනුව ක්‍රමිකව ගෙවාගෙන යනු ලබන බව. | -එම - |
| (ii) සමූපකාර තොග වෙළඳ සංස්ථාවට හා සී/ස ශ්‍රී ලංකා සමූපකාර අලෙවි සංගමයට අරමුදලින් 2011 වර්ෂයේදී පිළිවෙලින් රු.මිලියන 152.5 ක් හා රු.මිලියන 25 ක් ලබා දී තිබුණි. සමූපකාර තොග වෙළඳ සංස්ථාවෙන් 2012 වර්ෂයේදී රු.මිලියන 60 ක් පමණක් අය වී තිබුණු අතර, 2020 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවිය යුතු ණය ශේෂය රු.මිලියන 92.5 ක් විය. සී/ස ශ්‍රී ලංකා සමූපකාර අලෙවි සංගමයෙන් 2020 ජනවාරි 01 දිනට අයවිය යුතු රු.මිලියන 4.4 ක මුදලින් සමාලෝචිත වර්ෂයේදී කිසිදු වාරිකයක් අය වී නොතිබුණි. | සමූපකාර තොග වෙළඳ සංස්ථාවෙන් අයවිය යුතු රු.මි.92.5 ක හිඟ ණය ශේෂය ගෙවා අවසන් කරන ලෙස සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ සභාපතිවරයාට දිගින් දිගටම ලිඛිතව දන්වා ඇති අතර සිහිකැඳවීම් ඉදිරිපත් කර ඇති බව. | -එම- |
| (iii) 2020 වර්ෂයේදී Covid – 19 වෙනුවෙන් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාහැරීම සඳහා අරමුදලෙන් රු.248,656,984 ක් ලබා දී තිබුණු අතර, ඉන් 2020 ඔක්තෝම්බර් 31 දින වන විට රු.96,325,848 ක් පමණක් අය වී තිබුණි. ඉතිරි රු.152,331,136 ක මුදල අරමුදලට ගෙවිය යුතු වගකීම් වලින් අඩුකර දක්වා තිබුණි. | මෙය ඉතා හදිසියේ රට තුළ උද්ගත වූ Covid19- වසංගත තත්වයේ පැතිරයාමත් සමඟම රට සම්පූර්ණයෙන්ම වසාදැමීම (Lock down) කිරීම හේතුවෙන් පළාත් සමූපකාර සමිති වලට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය නොමැති වීම මත, එම සමූපකාර සමිති සඳහා අත්‍යවශ්‍ය භාණ්ඩ සැපයීම වෙනුවෙන් දරන ලද වියදමක් බව දන්වා තිබුණි. | චක්‍රීය අරමුදල පිහිටුවීමේ අරමුණු වෙනුවෙන් පමණක් වියදම් දැරීමට වගබලා ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1974 ජනවාරි 10 දිනැති අංක 93/5 දරන ගැසට් පත්‍රය මඟින් පළ කරන ලද සමූපකාර රීතින්හි 43 වගන්තිය ප්‍රකාර සෑම ලියාපදිංචි සමූපකාර සමිතියක්ම තම වාර්ෂික ශුද්ධ ලාභයෙන් කොටසක් දායක මුදල් වශයෙන් සමූපකාර අරමුදලට ගෙවිය යුතු බවත්, සමූපකාර අරමුදලෙහි මුදල් යෙදවිය හැකිකාර්යයන් ලෙස සමූපකාර අධ්‍යාපනය, ව්‍යාප්ති හා ප්‍රචාරක වැඩ, සමූපකාර සමිතිවල කලමනාකරණ කාර්යක්ෂමතා දියුණු කිරීම හා සමූපකාර සමිතිවලට උපකාර කිරීම දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ අරමුදල සඳහා සමූපකාර සමිතිවල දායකත්වය රු.120,930,257 ක් වූ අතර මුළු වියදම රු.4,926,669 ක් විය. මෙම වියදමින් සමූපකාර දින උත්සව වියදම්, ග්‍රාමීය බැංකු පනත් සංශෝධනය වියදම් හා පුහුණු වැය වෙනුවෙන් රු.2,289,879 ක් දරා තිබුණු අතර, සමූපකාර සමිතිවලට උපකාර කිරීම වෙනුවෙන් කිසිදු වියදමක් දර නොතිබුණි. | සමූපකාර සමිති වලට උපකාර කිරීම සඳහා සමූපකාර සංවර්ධන අරමුදල මගින් රුපියල් මිලියන 01 ක මුදලක් 2020 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මගින් වෙන් කිරීම් කර තිබුනද, 2020වර්ෂයේ මාර්තු මස සිට පැවති කොවිඩ් 19 වාතාවරනය තුල සමිති මගින් නව ව්‍යාපෘති සිදු නොකරන ලද අතර ඒ සඳහා සමිති මගින්ද ඉල්ලීම් ඉදිරිපත් නොවීය .ඒ අනුව සමිති වෙත ව්‍යාපෘති සඳහා ආධාර ලබාදීමට නොහැකි විය. | ගැසට් පත්‍රයට අනුව කටයුතු කිරීමට වගබලා ගත යුතුයි. |
| (ආ) | 2020 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව සමූපකාර සමිති වලින් මූල්‍ය ප්‍රකාශන 105 ක් ලබාගැනීමට සැලසුම් කර තිබුණද, මූල්‍ය ප්‍රකාශන 54 ක් පමණක් ලබාගෙන තිබුණි. තවද සීමාසහිත සමූපකාර බන්ධනාගාර දෙපාර්තමේන්තු සණස, සීමාසහිත තේ නිපදවන්නන්ගේ සමූපකාර සංගමය, සීමාසහිත ධීවර සමූපකාර සංගමය හා සී/ස රාජ්‍ය සේවා උපාධිධාරී සණස 2017 වර්ෂයෙන් පසුව ද, රාජ්‍ය සේවා සණස 2018 වර්ෂයෙන් පසුව සහ තවත් සමූපකාර සමිති 14 ක් 2019 වර්ෂයට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂයේ රටේ උද්ගතව පැවති කෝවිඩ් තත්වය හේතුවෙන් සමූපකාර සමිති/සංගම් වසා තැබීමට සිදුව තිබූ බැවින් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ ප්‍රමාදයක් සිදු වූ බවත් එකී හේතුව මත ක්‍රියාකාරී සැලැස්ම මඟින් අපේක්ෂිත මූල්‍ය ප්‍රකාශණ ලබාගැනීමට නොහැකි වූ බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ කාර්යයන් ඉටු කිරීමට වගබලා ගත යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2020 වර්ෂයේ විගණන සැලැස්මට අනුව මූලා ප්‍රකාශන 111 ක් විගණනය කිරීමට සැලැසුම් කර තිබුණ ද විගණනය අවසන් කර විගණන වාර්තා නිකුත් කර තිබුණේ මූලා ප්‍රකාශන 37 ක පමණි. නිකුත් කර තිබුණු විගණන වාර්තා 37 න් 17 ක් 2020 වර්ෂයට පෙර වර්ෂ වලදී ලද මූලා ප්‍රකාශන වන අතර 2020 වර්ෂයේ ඉදිරිපත් කර තිබුණු මූලා ප්‍රකාශන 54 න් මූලා ප්‍රකාශන 34 ක විගණන කටයුතු අවසන් කර විගණන වාර්තා මුදා හැර නොතිබුණි. | 2020 වර්ෂයේදී විගණනය අවසන් කර විගණන වාර්තා 46 ක් මුදා හැර ඇති බවත් සමිති හා සංගම් විසින් 2020 වර්ෂයේ ඉදිරිපත් කර තිබූ මූලා ප්‍රකාශන 54න් 2020-12-31 දින වන විට මූලා ප්‍රකාශණ 08ක පමණක් විගණන කටයුතු අවසන් කර විගණන වාර්තා මුදාහැර නොතිබුණු බව. | විගණන සැලැස්මට අනුව කාර්යයන් ඉටු කිරීමට වගබලා ගත යුතුයි. |